Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved]

04 S

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2570 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

(04) බෞද්ධ සංස්කෘතිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් හතරකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) සීලයේ සිව්වැදෑරුම් ප්‍රභේදය නම් කොට, ඒවායින් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   (ii) "සිව්පසය පරිභෝග කිරීමේදී ප්‍රත්‍යවෙක්ෂා කිරීම භික්ෂූන් වහන්සේගේ ප්‍රධාන චාරිත්‍රයකි." පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) භික්ෂූන් වහන්සේ තමකගේ දෛනික පැවිදි ජීවිතය හා බැඳී ඇති සිරිත් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08 යි)

2. (i) 'පිය-පුතු සබඳතාව' පහදා, භික්ෂු සමාජයේ ගුරු-ගෝල සබඳතාවේ යහපැවැත්ම උදෙසා පිය-පුතු සබඳතාව පූර්වාදර්ශ කරගත හැකි අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)
   (ii) භික්ෂූන් වහන්සේට අදාළ වන 'වත්' හතරක් නම් කොට, ඒවායින් එකක් හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (iii) ගුරුවරයකු සිය ශිෂ්‍යයා කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

3. (i) සතර සංග්‍රහ වස්තු පිළිවෙළින් නම් කොට, දෙවන සංග්‍රහ වස්තුව හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (ii) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ඇතුළත් 'දස සත්විනිවත්' අතුරෙන් හතරක් ලියා දක්වා, ඒවායින් එකක් හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (iii) "යහපත් පාලකයකු සතර අගතියෙන් වැළකී කටයුතු කළ යුතු ය." සනිදර්ශනව පහදන්න. (ලකුණු 08 යි)

II කොටස

4. (i) අනුරාධපුර යුගයේ මුල් අවධියේදී විශාල දාගැබ් ඉදිව පැවති බව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (ii) ථූපාරාම දාගැබ පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)
   (iii) සද්ධාතිස්ස රජතුමාගේ චරිතය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

5. (i) මැදිරිගිරියේ වටදාගෙය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)
   (ii) ලංකාතිලක විහාරය හෝ ගඩලාදෙණිය විහාරය ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය සම්බන්ධයෙන් වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)
   (iii) 'ටැම්පිට පිළිම ගෙවල්' විශේෂය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08 යි)

Past Papers Wiki

6. (i) පොළොන්නරු යුගයේ සඳකඩපහණ පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) පැරණි ලක්දිව රාජකීය හා පූජනීය ගොඩනැගිලි දොරටුවල දක්නට ලැබුණු කලා නිර්මාණ හතර නම් කොට, ඒවායින් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(iii) සීගිරි සිතුවම පිළිබඳ හැඳින්වීමක් කොට, බෞද්ධ චිත්‍ර කලාව සම්බන්ධයෙන් ඒවායෙහි ඇති සබඳතාව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

III කොටස

7. (i) නව අරහාදී බුදුගුණ වස්තු විෂය කරගත් ගද්‍ය කෘති හතරක් නම් කොට, ඒවා අතුරෙන් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) පූජනීය වස්තූන් මුල් කරගනිමින් රචිත පැරණි ගද්‍ය කෘති තුනක වස්තු විෂයන් හා කතුවරුන් නම් කරන්න. (ලකුණු 06 යි)

(iii) ග්‍රන්ථයේ කතුවරයා, අරමුණ, වස්තු විෂය හා පදනම් කරගත් මුල් ග්‍රන්ථය යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් 'සද්ධර්මරත්නාවලිය' පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 08 යි)

8. (i) ජාතක කතා වස්තු විෂය කර ගනිමින් රචිත පැරණි කාව්‍ය ග්‍රන්ථ තුනක් නම් කොට, එම ග්‍රන්ථවලට වස්තු විෂය වූ ජාතක කථා හා ග්‍රන්ථ කතුවරුන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(ii) 'තුන් සරණය' කාව්‍ය ග්‍රන්ථය සාමාන්‍ය ගැමි බෞද්ධ ජනතාව අතර ප්‍රචලිත වූ පද්‍ය කෘතියක් වීමට බලපෑ හේතු සනිදර්ශනව විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) බෞද්ධයා තුළ ශ්‍රද්ධාව ජනනයවීමටත්, කුසල-අකුසල පිළිබඳ අවබෝධය වර්ධනයවීමටත් 'ජාතක පොත්මහන්සේ' ඉවහල් වූ අයුරු සනිදර්ශනව පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

IV කොටස

9. (i) ථායිලන්ත බුදුදහමේ ව්‍යාප්තියට අදාළ යුග හතර නම් කොට, ඒවා අතුරෙන් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) ථායිලන්ත භික්ෂූන් වහන්සේලා කැලණියේදී උපසම්පදා වීම, ථායිලන්ත ශාසනික ප්‍රබෝධයකට ඉවහල් වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ථායිලන්ත භික්ෂු සමාජයේ යහපැවැත්ම උදෙසා සංඝ සංවිධානයේ සුවිශේෂ බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

10. (i) ජපානයට බුදුදහම සම්ප්‍රාප්තවීම හා එරට බුදුදහම ව්‍යාප්ත වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) බුදුදහමේ ආභාසයෙන් ජපන් ජන සමාජය හැඩගැසුණු අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iii) හෙයින් යුගයේදී ජපන් බෞද්ධ සංස්කෘතිය තුළ සිදු වූ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

❊ ❊ ❊

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library